// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2424/26 - 2025 පෙබරවාරි මස 18 වැනි අඟහරුවාදා - 2025.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු. 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂය යටතේ, 1989 අංක 12 පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2(1)(අ) උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර වන මා විසින් සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර මෙම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය සභාවලට මෙයින් බලය දෙනු ලැබේ.

මහාචාර්ය **ජයන්ත ලාල් රත්නසේකර**,
ගරු ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
පහළ පාර, ඕර්ස් හිල්,
ත්‍රිකුණාමලය.

1A - PG 7036 — 05 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මුදල් ණයට දීමේ ව්‍යාපාර සිදු කරන තැනැත්තන්ට බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව**

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුදල් ණයට දීමේ ව්‍යාපාර සිදු කරන තැනැත්තන්ට, බලපත්‍ර දීම සඳහා, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියේ xxix වන උප වගන්තියෙන් ලැබී ඇති බලය යටතේ මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

2. (1) සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ලබා ගෙන ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුණ ද, 90 වන අධිකාරය වූ බඩු උකස් ගන්නන් පිළිබඳ ආඥාපනත, 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධිත) පනතින් සංශෝධිත 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය. 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය. 1988 අංක 30 දරන බැංකු පනත, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත, 2006 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හෝ 2017 අංක 02 දරන දිවි නැගුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 01 දරන සමෘද්ධි පනත සහ වෙනත් රජයේ නෛතික අණ පනත් යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති කවර හෝ මුදල් ණයට දීමේ හෝ උසස් ගැනීමේ හෝ මූල්‍ය ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන අවස්ථාවක එම ව්‍යාපාර සම්බන්ධයෙන් මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

3. (1) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අපේක්ෂා කරන සෑම තැනැත්තකුම මෙහි පළමු වන උපලේඛනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කර අදාළ ලේඛන හා ආපසු නොගෙවන රු 100,000.00 ක ඉල්ලුම් පත්‍ර ගාස්තුවක් සමඟ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්කිරීමේ පිළිවෙල

(2) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සභාව වෙත විධිමත් අයදුම්පත්‍රයක් ඉදිරිපත් වූ පසු (3) උපවගන්තියේ වන කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර, එම කමිටුවේ තීරණය මත පමණක් සභාපතිවරයා විසින් බල පත්‍රය නිකුත් කළ යුතුය.

(3) මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධි විධාන සම්පූර්ණ කර ඇති විටක, පහත සඳහන් කමිටුවක නිර්දේශය මත ⋆ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය මෙහි දෙවන උපලේඛනයට සාරානුකූල විය යුතුය. ⋆⋆1. උප සභාපතිවරයා 2. සභිකයන් තිදෙනෙකු (කාන්තා නියෝජනය සහිතව) 3. බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් නම් කරනු ලබන පොලිස් ස්ථානාධිපතිවරයෙක් 4. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සමාජිකයෙකු 5. ලේකම් 6. ආදායම් පරීක්ෂක 7. පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ නියෝජිතයෙකුගෙන් යුත් නව දෙනෙකුගෙන් යුතු කමිටුවකින් සමන්විත වේ.

(4) සණ පූර්ණය 2/3 කි. තීරණ ඡන්දය කමිටු සභාපතිට හිමි වේ.

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය. බලපත්‍රයක් ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු කොන්දේසි

(අ) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය. අවුරුදු 18 ට වැඩි විය යුතුය.

බහු ජාතික සමාගමක් නම් ඉල්ලුම්කරුට හිමි කොටස් ප්‍රමාණය සලකා බැලිය යුතුය.

(ආ) අයදුම්කරු ශ්‍රී ලංකා අධිකරණයේ වරදකරුවකු නොවීය යුතුය. (මේ සම්බන්ධ ශ්‍රී ලංකා පොලීසිය විසින් සනාථ කර තිබිය යුතුය)

(ඇ) මුදල් ණයට දීමේ සහ ආපසු අය කර ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කාර්යාලයක් විවෘත කර පවත්වා ගෙන යා යුතු අතර, අදාළ ස්ථානයේ අයිතිය වසර 03 ක් වත්

ඉදිරියට තිබෙන බව සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතුය. (බදු අයිතිය නම් ලියාපදිංචි කළ බදු අයිතිය වසර 03 ක් වත් අවමය තිබිය යුතුය.) කාර්යාලය පවත්වන ගොඩනැගිල්ලට පහසු ප්‍රවේශ මාර්ගයක් සහිතව ප්‍රමාණවත් වාහන නැවැත්වීමේ ඉඩකඩ සපයා තිබිය යුතුය.

(ඈ) අයදුම්කරු සම්බන්ධව සභාව විසින් අවස්ථානුකූලව නියම කරනු ලබන, වත්කම් පිළිබඳ තොරතුරු පූර්ව ණය ලබා දීම් සම්බන්ධ තොරතුරු, ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු, අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිනම් ඊට අදාළ තොරතුරු. වෙනත් ප්‍රදේශවල මීට සමාන ව ණය ලබා දෙන ස්ථාන පවතී නම් ඊට අදාළ තොරතුරු, ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් ආදයම් සහතිකය, ආදායම් බදු ගෙවීමට අදාළව තොරතුරු ඇත්නම් එම ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(ඉ) ස්ථානයේ ගොඩනැගිලි ආරක්ෂාව සහ මුදල්වල ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු ස්ථානයක් වන බවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) අදාළ ස්ථානය වෙනුවෙන් ලබා ගත් වෙළඳ බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

(උ) මුදල් ණයට දීමේදී භාවිතා කරනු ලබන පහත සඳහන් ලේඛන භාෂාත්‍රයෙන් සකස් කර තිබිය යුතු අතර, අදාළ ලේඛනවල ආදර්ශයක් බැගින් ඉල්ලුම්පත්‍රය සමග දිව්රුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

i. ණය අයදුම්කරු ඉදිරිපත් කළ යුතු වන ඉල්ලුම් පත්‍රය

ii. ණය ආපසු ගෙවීම් පිළිබඳ ණය හිමියා විසින් ඉදිරිපත් කරනු ලබන සියළු කොන්දේසි ඇතුලත් ණය හිමියා සහ ණයගනු ලබන තැනැත්තා විසින් අත්සන් කළ යුතු ගිවිසුම.

iii. මුදල් අයකර ගැනීමේදී නිකුත් කරනු ලබන ලදුපත

iv. ණය දීම වෙනුවෙන් අයකරනු ලබන පොළිය මහ බැංකුව විසින් ප්‍රකාශ කරනු ලබන වාර්ෂික පොළියට 3%ක් නොඉක්මවන වාර්ෂික පොළියක් බවට ඉදිරිපත් කරනු ලබන දිව්රුම් ප්‍රකාශය.

v. ලබා දෙනු ලබන ණය මුදල සඳහා තබා ගන්නා ඇපය හෝ ඇපකරුවන් කවරාකාරී ද යන්න පැහැදිලිව සහතික කළ ප්‍රකාශයක්

vi. කිසියම් අවස්ථාවක ණය ගැතියා විසින් ලබා ගත් ණය පැහැර හැර ඇති විටෙක එය අයකර ගන්නා ආකාරය දැක්වෙන දිව්රුම් ප්‍රකාශයක්.

vii. කිසියම් මුදලක් ණයට දීමේ ව්‍යාපාරයක් සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් කලින් අවලංගු කර නොමැති අවස්ථාවක සහ ඒ බලපත්‍රයේ වලංගු කාල සීමාව ඉකුත් වන දිනෙන් පසුව එළඹෙන වර්ෂය සඳහා අලුත් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදි කලින් වර්ෂවල ඉදිරිපත් කරන ලද විස්තරවල වෙනස්කමක් සිදු වී ඇත්නම් මිස නැවත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබිය යුතු අතර, ලියාපදිංචි විගණකයෙකු විසින් සහතික කරන වාර්ෂික ගිණුම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්

අ. බලපත්‍රලාභියා විසින් කවර හෝ තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.

ආ. නිකුත් කර ඇත්තේ කවර ස්ථානයක කාර්යය කරගෙන යෑම සඳහාද ඒ ස්ථානයෙන් බැහැර වෙනත් ස්ථානයක ඒ කාර්යය කිරීම නොකළ යුතුය.

ඇ. කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එම බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද එම වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් විය යුතුය.

6. මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන කවර හෝ තැනැත්තකකු විසින් මෙහි පහත දැක්වෙන කොන්දේසි අනුව ක්‍රියා කරනු ලැබිය යුතුය.

(අ) 4(ඇ) ඡේදයේ සඳහන් ස්ථානයක නොවන වෙනත් කවර හෝ ස්ථානයක මුදල් ණයට දීම හෝ ආපසු අය කර ගැනීම හෝ නොකළ යුතු ය.

(ආ) 4(උ) ඡේදය යටතේ ඉදිරිපත් කර ඇති ආකෘති නොවන වෙනත් යම් ආකෘතියක් මුදල් ණයට දීමේ දී භාවිත නොකළ යුතුය.

(ඇ) ණයට ගන්නා සමඟ අත්සන් තබන ගිවිසුම පිටපත් තුනකින් සකස් කළ යුතු අතර ඉන් එක් පිටපතක් ණයට ගන්නා වෙත ඒ අවස්ථාවේදීම ලබා දීම කළ යුතුය. එකී ණය ගිවිසුම ණය හිමියාගේ මව් භාෂාවෙන් (සිංහල/ දෙමළ) ලබාදිය යුතුය.

(ඈ) ණය හිමියා විසින් ණයට ගන්නා තැනැත්තාගෙන් ආපසු අය කරගනු ලබන සෑම මුදලක් සඳහාම ලදුපතක් නිකුත් කළ යුතු අතර එම ලදුපතෙහි අය කර ගත් වාරික මුදලේ ප්‍රමාණය, පොලී මුදල, ණය ගෙවීම ප්‍රමාද වීම මත අය කරනු ලබන යම් ප්‍රමාද ගාස්තුවක් වේ නම් ඒ මුදල් ප්‍රමාණය සහ එම ලදුපත මත අය කර ගත් මුළු මුදල ද පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.

(ඉ) ණය ආපසු අය කර ගැනීම මාසික පදනම මත සිදු කළ යුතුය.

(ඊ) අය කරනු ලබන ණය වාරික, පොලිය සහ වෙනත් ගාස්තු බැංකු ගිණුමක් හරහා සිදු කිරීමට හෝ මුදලින් ගෙවීමට ඉඩකඩ සලස්වා තිබිය යුතුය.

(උ) සෑම වර්ෂයක ම ජනවාරි මාසයේ සහ ජූලි මාසයේ 10 වන දිනට පෙර මුදල් ණයට දීමේ ව්‍යාපාරය විසින් ලබා දෙන ලද සහ අය කර ගන්නා ලද මුදල් ප්‍රමාණය, ලබා ගත් ණය ආපසු ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ සංඛ්‍යාව හා එසේ අය වීමට ඇති මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න දැක්වෙන විගණකවරයෙකු විසින් සහතික කළ මූල්‍ය ප්‍රකාශයක් හෝ පුද්ගලයෙකු නම් දිවුරුම් ප්‍රකාශයක් සභාපතිවරයා වෙත සහතික කර ඉදිරිපත් කළ යුතු ය.

(ඌ) බලපත්‍රය ණය දෙන ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතුය.

7. මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන කවර හෝ තැනැත්තකු විසින් යම් තැනැත්තකුට ණයට දෙනු ලබන මුදල් ප්‍රමාණය තීරණය කිරීමේ දී, ඒ ණය ගැතියා විසින් එම මුදල ආපසු ගෙවීමට ඇති හැකියාව සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ආදායම් වාර්තාවක් අනුව ආපසු ගෙවීමේ හැකියාවේ ප්‍රමාණය ඉක්ම වූ මුදලක් ණයට දීම නොකළ යුතු ය.

8. කිසියම් ණය ගැතියකු විසින් ණය ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ණය මුදල ගෙවන ලෙස ඒ ණයගැතියාට තර්ජනය කිරීම හෝ බලපෑම් කිරීම හෝ ඔහුගේ කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් බලහත්කාරයෙන් අත්කර ගැනීම මානසික හිංසනයට පත් කිරීම නොකළ යුතුය.

9. (1) මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යන සෑම තැනැත්තකු ම ස්වකීය ව්‍යාපාරය සම්බන්ධයෙන් ගිණුම් හා ගිණුම් පොත් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර වර්ෂය අවසානයේ ගිණුම් ප්‍රකාශයක් පිළියෙළ කර ලියාපදිංචි විගණකවරයකු ලවා එම ගිණුම වාර්ෂිකව විගණනය කරවා ගත යුතුය.

*ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වාර්ෂික ගිණුම් ප්‍රකාශය*

(2) විගණකවරයා විසින් සහතික කරනු ලැබූ වාර්ෂික ගිණුම ප්‍රකාශයේ පිටපතක් මසක් තුළ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරගෙන යනු ලබන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

10. සභාපතිවරයාට හෝ ඔහුගෙන් බලයලත් නිලධාරියෙකුට, මෙම අතුරු ව්‍යවස්ථා අදාළ වන කවර හෝ ස්ථානයකට නිසි කාලය තුළ, මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කොන්දේසි නිවැරදිව අනුගමනය කරනු ලැබ තිබේද යන්න පරීක්ෂා කිරීමට බලය තිබිය යුතුය. එසේම එම ස්ථානයේ අයිතිකරු හෝ ඒ ස්ථානයේ ඔහු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන කවර හෝ තැනැත්තකු ඒ සඳහා ඉඩ දිය යුතු අතර කවර හෝ තැනැත්තකු විසින් එම පරීක්ෂා කිරීම වැළැක්වීම හෝ ඊට බාධා කිරීම නොකළ යුත්තේය.

*කාර්ය ස්ථාන පරීක්ෂා කිරීමේ බලය*

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ කොන්දේසි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම උල්ලංඝණය කර ඇති බව හෝ කඩ කර ඇති බව සභාපතිවරයාගේ මතය වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය එකී කොන්දේසිවලට හා විධි විධානවලට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සෑම හා සියලු ම දේ ඉටු කරන ලෙසට සභාපතිවරයා විසින් බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම

12. 11 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. කෙසේ වුවද නියම කරනු ලැබ ඇති දිනය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත්, එසේ දීර්ඝ කරනු ලබන කාලය දින දාහතරකට (14) නොවැඩි විය යුතුය.

නියම කළ ආකාරයෙන් ක්‍රියාකළ යුතු බව

13. (1) 11 වන වසන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ පසු අවස්ථාවක දී දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, සභාපතිවරයා විසින් ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලබන බලපත්‍රය අවලංගු කරනු ලබන ලිඛිත දැන්වීමක් යොමු කිරීම නීත්‍යානුකූල විය යුතුය.

නියමය පැහැර හැර ඇති විට බලපත්‍රය අවලංගු කිරීමේ බලය

(2) අවලංගු කළ බවට පොදු ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුයි. (භාෂාත්‍රයෙන්)

(3) එවැනි දැන්වීමක් යොමු කර තිබියදී දිගින් දිගටම නොකඩවා පවත්වාගෙන යන්නේ නම් ප්‍රාදේශීය සභා පනතේ 167 වන වගන්තිය පරිදි සමාප්ති ආඥාවක් ඉල්ලුම් කළ යුතුය.

(14) යම් ප්‍රාදේශීය සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් මගින්, එම අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝණය වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු වෙත ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් යුත් දඬුවමක් නිසි අධිකරණයක් විසින් ලබා දිය යුතුය.

කඩ කිරීමකදී හෝ උල්ලංඝණය කිරීමකදී දඬුවම

(15) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම සම්මත අතුරු ව්‍යවස්ථාවල

අර්ථ නිරූපණය

"තැනැත්තා යන්නෙන්, සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල කණ්ඩායමක් ද ඇතුළත් වේ.

"ණය ගැතියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා යටතේ යම් මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන කැනැත්තකුගෙන් මුදලක් ණයට ලබාගෙන ඇති හා ඒ ණය මුදල පියවා අවසන් කර නැති තැනැත්තකු ද,

"ණය හිමියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා අදාළ වන යම් මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තකු ද අදහස් වේ.

"මුදල් ණයට දෙන ව්‍යාපාරයක් " යන්නෙන් ඉහත අතුරු ව්‍යවස්ථාවේ අංක 2(1) වගන්තියෙහි සඳහන් ව්‍යාපාරයන්ට නොගැනෙන ප්‍රාදේශීය සභා සීමාව තුළ තම කටයුතු පවත්වාගෙන යන මුදල් ණයට දීමේ සේවාව ලබා දෙන ආයතන ඇතුළත් වේ.

EOG 02 - 0209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.